# ජේසු තුමාගේ උත්පත්ති ග්‍රහ බලය හා දේව ශක්තිය

ආයුර්වේද වෛද්‍ය හා ජෝතිෂ විශාරද
ස්ටැන්ලි ධර්ම කුමාර
සිද්ධාර්ථ ජෝතිෂ අසපුව

කරුණාව, දයාව, අනුකම්පාව පෙරටු කරගත් වෛරය තුරන් කොට සාමය හා සමාදානය දායාදය කර ගනිමින් මීට වසර 2019 කට පෙර උපත ලද ලොව ගැලවුම්කරු ලෙස ජේසුතුමන්ගේ ජීවිතයට බලපෑ බොහෝ කරුණු එතුමාගේ ජන්ම පත්‍රයේ මනාවට පැහැදිලි කරයි.
සෑම බලවත් විශේෂ උතුමෙකු ලොවට බිහිවන විට විශ්වය තුළ අපූර්ව දර්ශණ පහළ වේ. ජේසුතුමන් උපදින අවස්ථාවේදී ද මෙවැනි දර්ශන බෙත්ලෙහෙම පුරාම පැතිර පවත්නේය.

බයිබලයේ සඳහන් අන්දමට එකල තාරකා ශාස්ත්‍රය දැන් ශාස්තෘවරුන් විසින් අහසේ බිහිවන ග්‍රහ තාරකා ගැන පරීක්ෂා කරමින් එදින ලොවට උතුමෙකු බිහිවන බව එකල සිටි ගස්පාර් බෙලිම්මොරු බල්තසාර් වැනි උගත් ශාස්තෘවරු ප්‍රකාශ කර ඇත.
එදින අහසේ අසිරිමත් තරු බිහි වය රශ්මි දහරාවන් බෙත්ලෙහෙම් පුරය සිසාරා ගහනය විය. එය දුටු ශාස්තෘන් පැවසුවේ ලොව ගලවා ගැනීමට ඇති උතුම් ගැලවුම්කරුවෙකු අනිවාර්යෙන්ම මෙලොවට උප්පත්තිය ලබා ඇති බවයි.
කල්වේලා ඇතිව අනාවැකි පැවසූ එම ශාස්තෘවරුන් එම තාරකා ඔස්සේ ලොව ගැලවුම්කාරයා සොයමින්




බෙත්ලෙහෙමට ගියහ. මීට පෙර දේවදූතයන් පැමිණ ජේසුතුමාගේ පියාණන් වූ ජුසේතුමාට සිහිනෙන් මෙසේ පවසා ඇත. දුවිත්ලේ ජේසෝ පුත්ට මරියා විවාහ කර දෙන ලෙස ඉල්ලීම කළේය. ඉන්පසු දේවදූතයන් පැවසුවේ මරියාට දරුවෙකු ලැබෙන්නේ ඉතා ශුද්ධාත්මානුකූල පුතෙකු බව දැන්විය.

එම පින්වත් පුතාට ජේසුක්‍රිස්තුස් වහන්සේ නාමය යොදන ලෙස ශාස්තෘවරු පැවසීය. උන්වහන්සේ ජනයා පාපයෙන් මුදා ගන්නා බව ලොවට ප්‍රකාශ කළහ.

වසර 2019 ක ට පෙර සඳුදා දිනක මධ්‍යම රාත්‍රි 12.00 ට පමණ කන්‍යා ලග්නයෙන් හා මේෂ නවාංශකයෙන් මෙලොවට බිහිවූ එතුමාගේ ජන්ම පත්‍රය විශ්ලේෂණාත්මකව පරීක්ෂා කිරීමේදී ලග්නයේ චන්ද්‍රයාද 4 වන රාශියේ සිකුරු ග්‍රහයාද , රවි බුධ නම් බලවත් ග්‍රහයන් දෙදෙනා 6 වැනි ස්ථානයේද කුජ ගුරු නම් ග්‍රහයන් 7 වන ස්ථානයද අරක්ගත් වීම හා 10 වන රාශියේ ශනිද බලවත්ව පිහිටීම අනුව මෙම ජන්ම පත්‍රයේ උපතින්ම ඉතා බලසම්පන්න ග්‍රහයෝග හා ග්‍රහ බලපෑම් විශාල වශයෙන් පිහිටා ඇති බව පෙනේ

මෙම ජන්ම පත්‍රය විග්‍රහ කිරීමේදී

## ගජ කේශර යෝගය

නම් මහා බලවත් රාජයෝගය ලග්නයේ චන්ද්‍රයාද 7 වන ස්ථානයේ ගුරු ද පිහිටීම නිසා මෙම ජන්ම පත්‍රයට හා මෙතුමාට ඉතා බලයක් ලැබී ඇත.

## ගුරු හංස මහා පුරුෂ යෝගය

ගුරු 7 මීන රාශියේ පිහිටීම නිසා ඉතා බලවත් ධාර්මික ඥානයෙන් යුත් අවංක කෙනෙකු බව පැහැදිලියි.

## කුජ මංගල දෝෂය

කුජ ග්‍රහයා 7 පිහිටීම නිසා කුජ මංගල දෝෂ නම් දෝෂයද බලපා ඇත.

## සරස්වති යෝගය

රවි හා බුධ ග්‍රහයන් දෙදෙනා එකතුව 6 පිහිටීම නිසා සරස්වති යෝගය උපතින්ම අනුන්ගේ සිත දක්නා ඥානය පිහිටා ඇත.

## ධර්ම කර්මාධිපති යෝගය

11 අධිපති චන්ද්‍රයා ලග්නයේ පිහිටීම හා 2 අධිපති ශනි 10 පිහිටීම නිසා පෙර කල කුසල් හා කර්මවිපාක මෙලොවදී ම ලැබෙන යෝගයකි.

## කේතු ග්‍රහයා 9 පිහිටීම

ආගමානුකූල භාවනායෝගී මඟින් ලොවට සෙත සසපාල යෝගය ද ඇත.
ඉහත කී බලවත් යෝග ග්‍රහ පිහිටීම අනුව ඉතාම විරල පුද්ගලයෙකු ලොවට බිහි වීම මෙහි විශේෂත්වයයි.

මීට අමතරව ලග්නයේ චන්ද්‍රයා ද හතේ ගුරුද 10 ශනිද යන ත්‍රිකෝණයේ මිශ්‍රතාවය නිසා ලොව ගැලවුම්කරු ලෙස මෙතුමාට බලය ලැබීය.

ගුරු හංස යෝගය පැවැති විට පරිවාස පිරිස් , නුවණින් අගනැන්පත් , ධර්මය අවබෝධය , ධර්මය ප්‍රචාරය , ධර්මය ග්‍රහණයේ ප්‍රබලත්වය හා මිනිස් සිත තේරුම්ගෙන මිනිසාගේ ගැලවුම්කරු ලෙස මානසික සුවය ලබා දීමේ බලයද ලැබී ඇත. අවශ්‍ය ඕනෑම විටකදී මිල මුදල් , අස් , ඇත් , රිය , පාබල , හමුදාව හා අවශ්‍ය ආහාරපාන නොඅඩුව ලබන පෙර ආත්ම ගණනාවක සිට තම ධනය අනුන් වෙනුවෙන් පරිත්‍යාග බරමින් දුගී අසරණ අයට පිහිට වූ පුද්ගලයකු නිසා මෙලොවද මෙතුමාට මෙම ගුරු හංස මහා පුරුෂ යෝගය ලැබී තිබුනි.

ගජකේශරී යෝගය මගින් කථාවෙන් හා ක්‍රියාවෙන් ලොව මවිත කරමින් ජනයා තමා වෙත ඇද ගැනීමේ බලය හා අවශ්‍ය තැනදී කළ යුතු කාර්යය නොබියව ඉටුකිරීමේ බලය නිසා ආගිය තැන ප්‍රසිද්ධිය හා බලය ලැබෙනු ඇත. මෙම 7ට කුජද පැමිණීම නිසා කිසිදිනක කිසිම දේකට නොපැකිළව ඉදිරිපත් වී ජය ගැනීමේ බලය හා ශරීරයේ ශක්තිමත් හා දුක සැප විඳ දරා ගැනීමේ බලයද එතුමාට ලැබිය.

සරස්වතී යෝගය වන රවි බුධ යෝගය ද පිහිටීමෙන් හා ගුරු චන්ද්‍ර බලයද නිසා දේවත්වය කෙරෙහි භක්තිය හා භාවනායෝගී මානසික වර්ධන බලය ලැබීම නිසා මෙතුමාට ලොවු සිටින ඉතා දරුණු රෝගීන් සුව කිරීමේ විශේෂ බලයක් පිහිටා තිබුණි . එම ජීවශක්තිය ලබා දෙන මනසක් පිහිටියේය. එමනිසා එකල ලොවේ තිබූ දුර්භික්ෂය නිසා ඇතිවූ කුෂ්ඨ රෝගීන් , ලාදුරු රෝගීන් හා ක්ෂය රෝගීන් , අංගවිකල අය , මානසික රෝගීන් හා රුධිර විෂවූ මාරාන්තික රෝගීන්ද සුවකිරීමේ විශේෂ බලය ලැබී තිබීම නිසා මෙතුමාව දේවත්වය සැලකිය ශනි ග්‍රහයා 10 සිටීම පොදු ජනයාට සේවය කිරීමට ඇපකැප වුවත් රාජපාක්ෂික භාවයට කිසිසේත් යටත් නොවේ. එම නිසා මෙතුමාට කොපමණ වාසනා බලයක් පැවතුනත් සෙනසුරු ජන්ම ඊරාෂ්ඨක කාලයේ දී රජයේ නීතියට අවනත නොවීම නිසා කුරුසයේ ඇණ ගසා දඬුවම් විඳීමට සිදුවිය. එයද ලොව ජනයා පාපයෙන් මුදා ගැනීම පිණිස බව පැහැදිලිය. දින තුනකට පසු නැවතත් උපත ලබා ජීවමානව දර්ශණය වූ බවට බවට බයිබලයේ සඳහන් වේ.

තම චින්තන ශක්තියෙන් ඇන ගසා සිටි කුරුසයේ සිඳගෙනම සියලු ලෝ සතුන් වෙත සාමයේ කියා පෑවේය. එය ජන්ම පත්‍රය පිහිටි ආත්මකාරක බලයෙනි. ඉතා බලසම්පන්න බලයක් හිමිව තිබූ ජේසුතුමන්ගේ උප්පත්තිය වූයේ මිනිසා පාපයන් නිදහස් කර සාමය හා නිරෝගීභාවය ඇති කිරීමයි. එමනිසා උප්පත්ති භූමියෙන් ශුභ එල දුන්නේ නැත.

තැනින් තැන සංචාරය කරමින් දුගී දුප්පත් අසරණ ජනයාට සේවය කිරීමේදී ඇති වූ බාධක කරදර ඉවසීමෙන් හා දුරදක්නා නුවණින් පාලනය කිරීම එතුමාගේ විශිෂ්ඨ බලයකි. අවසාන කාලයේ ජේසුතුමා ඉන්දියාවේ දී කාලයක් ගත කළ බව ද විවිධ මත ඇත.

බයිබලයේ සඳහන් කරුණු උපයෝගී කරගනිමින් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ උපත හා ක්‍රියාදාමය පර්යේෂණාත්මකව විශ්ලේෂණය කර මෙම ජන්ම පත්‍රය හා ග්‍රහ බලය මා විසින් ඉදිරිපත් කිරීමට කටයුතු කලෙමි.




